**ලංකාපුර ප්‍රාදේශීය සභාව - 2022**

**---------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ලංකාපුර ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ලංකාපුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 3.5 යටතේ දක්වා තිබුණු ක්ෂය අනුපාතයන්ට වඩා ඉහළ අනුපාතයන්ගෙන් ස්ථාවර වත්කම් ක්ෂය කිරීම සිදුකර තිබුණි. | ආරම්භයේදී පැවති වත්කම් ආදාළ එළදියී ජීවිත කාලය පුරා හීන වන ශේෂ ක්‍රමයට ක්ෂය කරනු ලබන අතර අලුතින් මිලදී ගනු ලබන වත්කම් මූල්‍ය රීති මගින් හඳුන්වා දුන් ක්ෂය අනුපාත යටතේ ක්ෂය කරනු ලබන බව. | ශේෂ පත්‍ර සටහන් යටතේ හෙළිදරව් කරන ආකාරයට ගිණුම් තැබිය යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂයේ ගෙවීම් කර තිබුණු සමාලෝචිත වර්ෂයට අදාළ රු.93,508 ක් වූ වියදම් 03 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්යේ දෙසැම්බර් 31 දිනට වත්කම් වර්ග 04 ක වටිනාකම රු.79,398 ක් අඩුවෙන්ද, වත්කම් වර්ග 02 ක වටිනාකම රු.102,966 ක් වැඩියෙන්ද ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ වැඩ නිමකර ඇති වටිනාකම රු.1,926,936 ක් වූ පොදු සුසාන භූමියක වැට ඉදිකිරීමේ වියදම ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වර්ෂයේ පුනරාවර්තන වියදම් යටතේ වියදමට එරෙහිව කපාහැර ඇති බව. | -එම- |
| (ඈ) | ඉදිකිරීම් අතහැර දමා තිබුණු තඹාල සතිපොල ගොඩනැඟිල්ලේ වැඩ වටිනාකම රු. 1,678,127 ක් වුවත් ස්ථාවර වත්කම්හි කෙරිගෙන යන වැඩ යටතේ එම අගය | ජ'නල් සටහන් මගින් නිවැරදි කරන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| | රු.3,552,328 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඉ) | තඹාල සතිපොල භූමියේ ඉතිරිව පැවති රු.51,000 ක් වටිනා ඉදිකිරීම් ද්‍රව්‍ය තොගය ඉතිරි තොග යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |

### 1.6.3 නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් ශේෂ 04 ක මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ ඒවාට අදාළ ලේඛන/උපලේඛනවල දැක්වෙන අගයන් අතර රු.765,388 ක වෙනසක් විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදි වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23(ආ) වගන්තිය | 2022 වර්ෂයේදී කල් ඉකුත් වී තිබුණු පරිසර බලපත්‍ර 22 ක් අළුත් කර නොතිබුණි. | පරිසර බලපත්‍රය ලබා දීමට සුදුසුකම් සපුරා නොමැති බලපත්‍රලාභීන් සඳහා බලපත්‍ර ලබා දී නොමැති අතර අදාළ අඩුපාඩු සකස් කර ගන්නා ලෙස ලිපි මගින් දැනුවත් කළ බව. | පරිසර බලපත්‍ර සහිතව ව්‍යාපාර පවත්වාගැනීම සඳහා නියාමනය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අයභාරය ඉක්ම වූ වියදම රු. 6,614,736 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අයභාරය ඉක්ම වූ වියදම රු.7,524,216 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 681,900 | 165,000 | 165,000 | - | 411,900 | 674,000 | 524,200 | 149,800 |
| (ii) | කුලී | 18,560,707 | 17,329,003 | 16,574,036 | 2,618,233 | 11,525,747 | 10,506,861 | 8,328,695 | 2,178,166 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,169,100 | 1,386,323 | 1,056,023 | 330,300 | 1,018,200 | 896,142 | 825,342 | 70,800 |
| (iv) | වෙනත් ආදායම් | 14,660,020 | 12,001,313 | 3,374,335 | 25,579,244 | 8,850,830 | 13,768,916 | 6,078,928 | 16,952,267 |
| | | 35,071,727 | 30,881,639 | 21,169,394 | 28,527,777 | 21,806,677 | 25,845,919 | 15,757,165 | 19,351,033 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) කුලී** | | |
| (i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 09 ත් 11 ත් අතර කාලයක සිට හිඟව පවතින රු.1,350,308 ක් වූ එළහරක් මස්කඩ කුලී නිරවුල් කිරීම සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි. | 2023.02.21 දිනැති මහා සභාවේ ඊ 03 xi සභා තීරණය මගින් හිඟ කපා හැරීමට තීරණය කර ඇති අතර ඊට අදාළ කටයුතු සිදු කරමින් පවතින බව. | නිරවුල් කරගත යුතුය. |
| (ii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 08 ත් 10 ත් අතර කාලයක සිට හිඟව පවතින කුකුල් මස් කඩ කුලී ශේෂය රු.456,134 ක් විය. | 2023.02.21 දිනැති මහා සභාවේ ඊ 03 xi සභා තීරණය මගින් හිඟ කපා හැරීමට තීරණය කර ඇති අතර ඊට අදාළ කටයුතු සිදු කරමින් පවතින බව. | -එම- |
| **(ආ) බලපත්‍ර ගාස්තු** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළඳ බලපත්‍ර කර්මාන්ත බලපත්‍ර හා වෘත්තීය බලපත්‍ර ලබාගැනීමකින් තොරව ව්‍යාපාර පවත්වාගෙන ගොස් තිබූ ආයතන සංඛ්‍යාව 341 ක් විය. | පිළිතුරු ලබාදී නොමැත. | -එම- |
| **(ඇ) වෙනත් ආදායම්** | | |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ ආදායම රු.18,558,237 ක් හා මුද්දර ගාස්තු ආදායම රු.6,528,240 ක් විය. | උසාවි දඩ හා මුද්දර ගාස්තු අය කර ගැනීම සඳහා ඉල්ලීම් කර ඇති බව. | ආදායම් ගෙන්වාගත යුතුය. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **වත්කම් කළමනාකරණය**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | පිරිවැය රු.2,390,568 ක් වැයකර ඉදිකරන ලද තල්පොත නව බස් නැවතුම්පොළ වෙත බස් ඇතුල් නොකිරීම හේතුවෙන් වර්ෂ 06 කට අධික කාලයක් තිස්සේ නිෂ්කාර්යව පවතී. | ඉදිරියේදී වත්කම සුදුසු කාර්යක් සඳහා යොදවා ගැනීමට කටයුතු කරන බව. | පවත්නා වත්කම් මහජන සුභසිද්ධිය සඳහා යොදවාගත යුතුය. |
| (ආ) | වටිනාකම රු.95,912 ක් වූ කුබෝටා අත්ට්‍රැක්ටරය වර්ෂ 05 ක කාලයක සිට නිෂ්කාර්යව පවතී. | 2022 වර්ෂය සඳහා සිදු කරනු ලබන භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය මත ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කරන බව. | වත්කම් භාවිතා නොකරන්නේ නම් අපහරණය සඳහා කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු වටිනාකම රු.1,560,000 ක් වූ ජංගම වෙළඳ කුටි 06 න් 05 ක් අදාළ වෙළඳ කුටි ලබාගත් පුද්ගලයින් ඒවා භාවිතයට නොගැනීම හේතුවෙන් නිෂ්ක්‍රීයව පැවතුණු අතර, වෙළඳ කුටියක් ලබාගත් එක් පුද්ගලයෙකු විසින් අදාළ වෙළඳ කුටිය සභාව සමඟ එකඟ වූ ගිවිසුමට පටහැනිව බල ප්‍රදේශයෙන් පිටස්තර අයෙකු වෙත ලබාදී තිබුණි. | විගණන පරීක්ෂාවේදී ලද තොරතුරු මත අදාළ ජංගම වෙළඳ කුටිය සභාව සමග එකඟ වූ ගිවිසුම කඩ කිරීම නිසා සභාව වෙත පවරාගෙන ඇති බව. | ලැබී ඇති වත්කම් ඵලදායීව යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ සන අපද්‍රව්‍ය ඒකකය මගින් 2019 වර්ෂයේදී ස්ථාපනය කර තිබුණු කව්ෂිමා යන්ත්‍රය මගින් දිනකට නිෂ්පාදනය කළ හැකි කොම්පෝස්ට් ධාරිතාවය ටොන් 50 ක් පමණ වුවද, බල ප්‍රදේශයේ එවැනි ධාරිතාවක් රැස් නොවීම හා අනෙකුත් සභාවල දිරන කසල රැගෙන එමේ අධික පිරිවැය හේතුවෙන් ජනනය වන කසල ප්‍රමාණය අඩුවීම මත ධාරිතාවයෙන් සියයට 2 ක් පමණක් ප්‍රයෝජනයට ගත හැකි වී තිබීම නිසාත් නඩත්තු පිරිවැය හේතුවෙන් යන්ත්‍රය සඳහා වැය කර ඇති රු.මි. 145 ක ආයෝජනය ප්‍රතිඵල රහිත බවට පත්වී තිබුණි. | කෞෂිමා ව්‍යාපෘතිය සඳහා කරනු ලැබූ ආයෝජනය ප්‍රතිඵල රහිත එකක් බැවින් උපදෙස් ඉල්ලා ලිපි මගින් දැනුවත් කර ඇති බව. | ශක්‍යතා අධ්‍යනයකින් පසු සුදුසු ව්‍යාපෘති පමණක් ස්ථාපිත කිරීමට පියවර ගත යුතුය. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාවේ අනුමත සංවර්ධන නිලධාරි තනතුරු 05 න් 04 ක් ද, පුස්තකාලාධිපති තනතුරු 03 න් 02 ක්ද, පුරප්පාඩුව පවතින අතර, සෞඛ්‍ය කම්කරු පුරප්පාඩු 01 ක් සඳහා අනියම් සේවකයන් 08 දෙනෙකු සේවයේ යොදවාගෙන තිබුණි. | කාර්ය මණ්ඩල අවශ්‍යතා වාර්තා කර ඇති බව. | පුරප්පාඩු හා අතිරික්තතා සම්බන්ධව කටයුතු කළ යුතුය. |